බුලත්සිංහල ප්‍රාදේශිය සභාව
කළුතර දිස්ත්‍රික්කය
---------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාව සතුව පවත්නා ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ආ) මදුරාවල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 221,804 ක මුදලක් බුලත්සිංහල ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ බැවින් බුලත්සිංහල ප්‍රාදේශිය සභාවේ ගිණුම්වල එය ලැබිය යුතු මුදලක් ලෙස දැක්විය යුතු වුවත් එම ගිණුම්වල මදුරාවල ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු මුදලක් ලෙස රු. 331,130 ක් දක්වා තිබුණි.

(ඇ) 2017 වසරේදි සභාව විසින් සාදා නිම කරන ලද එකතු වටිනාකම රු. 435,720 ක් වූ මේස 11 ක්, හා වේදිකාවක් ප්‍රාග්ධනිත කිරිමට කටයුතු කර නොතිබුණි. එම නිසා එම වටිනාකමින් අදාල වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) මෝටර්රථ හා කරත්ත ගිණුම යටතේ වත්කම් ලෙස හඳුනාගෙන තිබූ රු. 54,865 ක් වටිනා කසළ කරත්ත 03 ක් ,2009 හා 2010 වසරවල සිදු කල වෙන්දේසිය මගින් ලේඛනයෙන් ඉවත් කර තිබුණ ද. ඒවා මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2010 වසරේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ වටිනාකම සඳහන් නොකොට ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන් ව තිබූ හා දැනට භාවිතයේ පවත්නා ට්‍රැක්ටරයක් හා ටේලරයක වටිනාකම හඳුනාගෙන ගිණුම් වලට ඇතුලත් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඊ) එකතු වටිනාකම රු. 10,720 ක් වූ බල්බ, වෙනත් මිලදි ගැනීම් හා බැටරි වලින් සමන්විත තොග අයිතම තුනක් හඳුනාගෙන ජංගම වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(උ) විවිධ අයිතමයන්ගෙන් සමන්විත එකතු වටිනාකම රු. 28,735 ක් වූ පොදු ගබඩා තොග ජංගම වත්කම් යටතේ අඩුවෙන් පෙන්වීම නිසා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) 2012 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට හේතුව නිරීක්ෂණය නොවූ රු.199,090 ක් සමුච්චිත අරමුදලට බැර කර තිබූ අතර අවිච්ඡේද කර්මාන්ත සඳහා බිල් කිරීම ලෙස රු.16,848,511 ක් එම ගිණුමට හර කර තිබුණි. කෙසේ නමුත් මෙම හර හා බැර කිරීම් වලට අදාල ප්‍රතිවිරුද්ධ සටහන් සමාලෝචිත වර්ෂය දක්වාම ගිණුම් ගතකර නොතිබුණි.

(එ) 2011 වර්ෂයේ අවිච්ඡේද කර්මාන්ත සඳහා ලැබිය යුතු රු.2,026,299 ක් ණයගැති ගිණුමට පමණක් හර කර තිබීම නිවැරදි කිරිම සඳහා 2012 වර්ෂයේදි අවිනිශ්චිත ගිණුම බැර කර තිබුණි. මෙම වරද නිසා ගිණුම්වලට ඇති වූ බලපෑම සමාලෝචිත වර්ෂය තුල දී වත් නිවැරදි කර නොතිබුණි.

(ඒ) 2011 වර්ෂයේ කර්මාන්ත ණය ගැතියන් කපා හැරීම රු.26,014,349 ක් කර්මාන්ත ණයගැති ගිණුමට පමණක් බැර කර තිබීම නිවැරදි කිරීම සඳහා 2012 වර්ෂයේදි අවිනිශ්චිත ගිණුම හර කර තිබුණි. මෙම වරද නිසා ගිණුම් වලට ඇති වූ බලපෑම සමාලෝචිත වර්ෂය තුල දී වත් නිවැරදි කර නොතිබුණි.

(ඔ) 2011 වර්ෂයේ කර්මාන්ත ණය හිමියන් රු.29,600,825 ක් වැඩියෙන් බිල් කිරීම ඉවත් කිරීම සඳහා කර්මාන්ත ණය හිමි ගිණුම පමණක් හර කිරීම නිවැරදි කිරීම සඳහා 2012 වර්ෂයේදි අවිනිශ්චිත ගිණුම බැර කර තිබුණි. මෙම වරද නිසා ගිණුම් වලට ඇති වූ බලපෑම සමාලෝචිත වර්ෂය තුල දී වත් නිවැරදි කර නොතිබුණි.

(ඕ) 2012 වර්ෂයේදි කර්මාන්ත මුදල් ගිණුමෙන් පොදු මුදල් ගිණුමට රු.2,600,000 ක් මාරු කිරීමේදී අදාල මුදල් ගිණුම හර හා බැර කර තිබියදි ආදායම් ආධාර ගිණුමද බැර කර තිබුණි. මෙම වරද නිසා ගිණුම් වලට ඇති වූ බලපෑම සමාලෝචිත වර්ෂය තුල දී වත් නිවැරදි කර නොතිබුණි.

(ක) 2011 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ගිණුම්කරණ අඩුපාඩු යටතේ (එ) ජේදයේ සඳහන් රු.470,407 ක හර සටහන පමණක් යෙදීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් හෝ නිවැරදි කිරීම් කර නොතිබුණි.

(ග) 2011 විගණකාධිපති වාර්තාවේ 2.2.4 ජේදයේ සඳහන් රු.1,338,486 ක ණයහිමි ශේෂය නිවැරදි කිරීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් හෝ කර නොතිබුණි.

1:3:2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

(අ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ හිටි වරිපනම් බදු හා අක්කර බදු ශේෂය රු.1,115,474 ක් වුවත්, හිඟ ආදායම් වාර්තාව අනුව එම ශේෂය රු. 1,162,430 ක් විය. ඒ අනුව රු.46,956 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ හිටි බදු කුලි ශේෂය රු. 25,967 ක් වු නමුත් හිඟ ආදායම් වාර්තාව අනුව එවැනි ශේෂයක් නිරීක්ෂණය නොවුණි.

1:3:3 <u>අවිනිශ්චිත ගිණුම්</u>

2017 ජනවාරි 01 දිනට රු.116,297 ක් වු අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.857,690 ක බැර ශේෂයක් දක්වා තව දුරටත් වර්ධනය වී තිබුණි.

1:3:4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

<u>ලැබිය යුතු ගිණුම්</u>

දීර්ඝ කාලයක සිට පැවත එන වීථි පහන් ආධාර හා වැට් බදු ලෙස පවතින පිළිවෙලින් රු.114,070 ක හා රු.410,901 ක ලැබිය යුතු ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1:3:5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

කර්මාන්ත ලේඛන හා අදාල උපලේඛන නොමැති වීම නිසා එකතුව රු.462,532 ක කර්මාන්ත ණයහිමි ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1:3:6: <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | - | සභාව සතු සියලු ඉඩම්, ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) මුදල් රෙගුලාසි 371(ඇ) | 43,859 | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් එම කාර්යය නිම වූ වහාම පිය විය යුතු වුවද, රු.43,859 ක් වූ අත්තිකාරම් ශේෂය 2018 අප්‍රේල් 23 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 236,000 | වර්ෂ 02 ක් ඉක්මවූ රු.236,000 ක් වූ තැන්පතු ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1647(ආ) | - | සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කළ යුතු වුවත් එවැනි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සභා වාහන වල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2:1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,069,143 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,480,372 ක් විය.

2:2 <u>ආදායම් පරිපාලනය</u>

2:2:1 <u>ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 3,453,767 | 3,299,717 | 2,669,707 | 980,244 | 3,447,880 | 3,320,487 | 4,083,565 | 596,282 |
| (ii) කුලී | 4,760,000 | - | 785,470 | - | 3,400,000 | - | 771,355 | - |
| (iii) බලපත්‍ර ගාස්තු | 560,000 | 548,995 | 601,765 | - | 340,000 | 276,404 | 378,324 | - |
| (iv) වෙනත් ආදායම් | 21,520,000 | - | 25,702,009 | - | 20,235,000 | - | 19,922,711 | - |

2:2:2 <u>ආදායම් රැස් කිරිමේ කාර්යසාධනය</u>

(අ) <u>වරිපනම්</u>

(i) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම රු.2,052,880 ක් වූ අතර ඉන් රු.1,231,285 ක් හෙවත් සියයට 59.9 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.446,162 න් රු.208,846 ක් හෙවත් සියයට 46.81 ක් පමණක් අයකර තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.1,058,911 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ වරිපනම් බදු අයකිරීමේ ප්‍රගතිය සියයට 57.63 ක අගයක් ගෙන තිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට රු.1,058,911 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 01 සිට වසර 03 දක්වා ඒකක 2249 කින් රු.962,282 ක, වසර 03 සිට 05 දක්වා ඒකක 29 කින් රු.53,871 ක් හා වසර 5 සිට වසර 10 දක්වා ඒකක 22 කින් රු.42,758 ක හිඟ ඇතුළත් විය. මෙම හිඟ මුදල අයකරගැනීමට සභාව විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

(ආ) <u>අක්කර බදු</u>

(i) සමාලෝචිත වර්ෂයේ අක්කර බදු බිල් කිරීම රු. 40,887 ක් වූ අතර ඉන් රු. 19,893 ක් හෙවත් සියයට 48.65 ක් පමණක් අය කර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ශේෂය වූ රු.87,457 න් රු.4,932 ක් හෙවත් සියයට 5.64 ක් පමණක් අයකරගෙන තිබූ අතර වර්ෂය අවසානයට මුළු හිඟය රු.103,519 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ අක්කර බදු අය කිරීමේ ප්‍රගතිය සියයට 19.34 ක් පමණ විය.

2.2.3 <u>වෙනත් ආදායම්</u>

(අ) <u>දැන්වීම් පුවරු ආදායම්</u>

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත පරිදි කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කරවීමේදී සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක බලය යටතේ පමණක් ප්‍රදර්ශනය කළ යුතු වුවත් එසේ බලය ලබා නොගෙන දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කර තිබුණි. නියැදි විගණන පරීක්ෂාවේදී එසේ බලය ලබා නොගෙන ස්ථිර දැන්වීම් පුවරු 14 ක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් රු. 47,008 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. 2017 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් පිළිබඳ සමීක්ෂණයක්ද සිදු කර නොතිබුණි.

(ආ) <u>රථ වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නවතාතැබීමේ ස්ථානවල නවතා තබන ත්‍රීරෝද රථ ලියාපදිංචි කරවාගෙන ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,735,667 ක් හා මුද්දර ගාස්තු රු.12,707,810 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

සභාව විසින් 2017 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් සභාව දැනුවත් වී තිබුණද එයට අදාළ පරිදි ව්‍යාපෘති 2017 වර්ෂය තුළ සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

3:2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) බුලත්සිංහල ප්‍රාදේශීය සභාව 2006 අප්‍රේල් 15 දින සිට බුලත්සිංහල හා මදුරාවල යනුවෙන් ප්‍රාදේශීය සභා දෙකකට වෙන් කිරීමේදී මදුරාවල ප්‍රාදේශීය සභාවට හිමි විය යුතු වත්කම් හා වගකීම් බෙදා වෙන් කර දිය යුතු වුවත් 2018 මැයි 02 දින වන විටත් එම වත්කම් හා වගකීම් බෙදා වෙන්කරදී නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ පවතින විථි පහන් කණු නිවැරදිව හඳුනා ගත හැකි වන පරිදි අංක කර පවත්වා ගැනීමට හෝ නිවැරදිව යාවත්කාලින කළ ලේඛනයක් පවත්වා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **සේවක පුරප්පාඩු**

(i) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ කාර්ය මණ්ඩල විස්තරය අනුව සභාවේ ආයුර්වේද වෛද්‍යවරු 02 ක් , පුස්තකාලයාධිපති තනතුරක් ,ආදායම් පරික්ෂක තනතුරක්, පෙර පාසැල් ගුරු තනතුරක් ,වැඩ පරික්ෂක තනතුරක් ,සෞඛ්‍ය පරික්ෂක තනතුරක්, සෞඛ්‍ය කම්කරු තනතුරු 02 ක් හා වැඩ කම්කරු තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි.

(ii) සභාව තුල අනුමත රියදුරු කාර්ය මණ්ඩලය ලෙස 12 දෙනෙකු සේවයේ යෙදී සිටියදී මාර්ග කම්කරුවකු හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් තිදෙනෙකු රියදුරු රාජකාරි සඳහා අනුයුක්ත කොට තිබුණි.

(ආ) සේවක ණය

සේවය හැර ගිය, මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.78,702 ක් වූ ණය ශේෂය 2017 දෙසැම්බර් 31 දින වන විටද අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 **වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

(අ) සභා බල ප්‍රදේශයට අයත් සුසාන භූමි 36 ක් පැවති අතර ඒවා ගැසට් කර සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඒවායින් සුසාන භූමි 06 ක පමණක් මැනුම් කටයුතු සිදුකර තිබුණි. තවද නිත්‍යානුකූලව පවරා නොගැනීම හේතුවෙන් සභාව සතු සුසාන භූමි බොහොමයක් බාහිර පාර්ශවයන් විසින් ප්‍රයෝජනයට ගෙන තිබුණි.

(ආ) සභාවට අයත් මාර්ග නිවැරදිව හඳුනාගැනීමට, ලේඛන ගත කිරීමට හා ගැසට් කර පවතින ලේඛන යාවත්කාලින කිරීමට කටයුතු කර නොතිබුණි**.**

3.4.2 **නිෂ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්**

(අ) සභාව විසින් රු.35,399,870 ක වියදමක් දරා 2016 දෙසැම්බර් 31 වන විට වැඩ අවසන් කර තිබු නව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල 2018 මැයි 03 වන විටත් උපයෝජනයෙන් තොරව පැවතුණි. තවද මෙම ගොඩනැගිල්ල නිවැරදිව අනුමත කරනු ලැබූ ගොඩනැගිලි සැලැස්මකින් තොරව ඉදිකර තිබුණි.

(ආ) සභාව විසින් මීට වසර ගණනාවකට පෙර වාහන නඩත්තු හා සේවා කිරීම් ඒකකයක් මීගහකුඹුර ප්‍රදේශයේ පිහිටුවා තිබූ අතර මෙම ඒකකය සහිත ඉඩම සභාව සතු නොවුණි. එම ඉඩම සභාවට පවරා ගැනිමට හෝ වත්කමක් ලෙස හඳුනා ගැනිමට කිසිදු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි. තවද 2016 හා 2017 යන වර්ෂවලට අදාලව රු. 500,000 බැගින් ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර තිබුණද 2018 ජනවාරි 23 වනදා වන විටත් මෙම මධ්‍යස්ථානයේ සේවා කටයුතු සිදු කිරිම ආරම්භ කර නොතිබුණි. කෙසේ වුවද මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරිම සඳහා රු. 73,350 ක මුදලකට ලබා ගත් උපකරණ දීර්ඝ කාලයක් තිස්සේ මධ්‍යස්ථානය තුල ගබඩා කර තිබුණි.

3.4.3 **වාහන උපයෝජනය**

(අ) කැබ් රථයක් හා ට්‍රැක්ටර 02 ක් වසර ගණනාවක් තිස්සේ ධාවනයෙන් ඉවත්කර තිබුණු අතර අළුත්වැඩියා කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට 2018 ජුලි 24 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු භාවිතයට ගනු ලබන වාහන 15 න් වාහන 11 කටම තෙවන පාර්ශවයේ රක්ෂණ ආවරණය පමණක් ලබා ගෙන තිබුණි.

(ඇ) සභාව සතු බොහොමයක් වාහන අළුත්වැඩියා කිරීම සභාවේ කාර්මික නිලධාරි විසින් සිදු කරනු ලබන අතර එම අළුත්වැඩියාවෙන් පසු ගලවා ඉවත් කරන අමතර කොටස් සම්බන්ධයෙන් නිවැරදි පාලනයක් සිදු කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

4:1 **අයවැය පාලනය**

(අ) ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ආදායම් විෂයයන් 06 කින් රු.5,060,000 ක ආදායමක් වර්ෂය තුළදී උපයාගැනීමට ඇස්තමේන්තු කර තිබුණද වර්ෂය තුළදී ඉන් කිසිදු මුදලක් උපයාගැනීමට හැකි වී නොතිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර ගෙන අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට සභාව ක්‍රියාකර නොතිබුණි.

5. **පද්ධති හා පාලනය**

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ---------- | | ---------- |
| (අ) | ගිණුම්කරණය | | ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ආ) | ආදායම් පාලනය | (i) | හිඟ ආදායම් අය නොවීම. |
| | | (ii) | දැන්වීම් පුවරු,බලපත්‍ර ගාස්තු ආදි ආදායම් නිවැරදිව හඳුනා ගැනීමට අදාල විධිමත් සමීක්ෂණ නොපැවැත්වීම |
| (ඇ) | අයවැය | (i) | අයවැය විචලන පරාසය විශාලවීම. |
| | | (ii) | ආදායම් ඇස්තමේන්තු කිරීමේදී එය තාත්වික අයුරින් සිදු නොවීම. |
| (ඈ) | ගබඩා පාලනය | (i) | ලේඛන විධිමත් පරිදි යාවත්කාලීන කර පවත්වා නොතිබීම. |
| | | (ii) | වාහන අබලි ලේඛනයක් නඩත්තු නොකිරිම |
| (ඉ) | සේවක කළමණාකරණය | (i) | නිවැරදි ක්‍රමවේදයක් යටතේ මාර්ග හා ක්ෂේත්‍ර කම්කරුවන් සේවයේ නොයෙදවීම |
| | | (ii) | සේවකයින්ගේ රාජකාරී අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම |